Department of Education,Sabaragamuwa Province/ Weekly School


පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව

සති පාසල

විෂය - පෙරදිග සංගීතය

අප්‍රේල් මාසය -3 සතිය

ශ්‍රේණිය - 9



සැකසුම - ගයානි චන්ද්‍රකාන්ති

ර/නිවි/ඇලපාත මහා විද්‍යාලය


## පුනරීක්ෂණ අභ්‍යාස -3

(1)

i. ගීත ගායනය සහ රසවින්දනය වින්දනාත්මක දිවියකට අත්‍යවශ්‍ය දෙයකි. භාවිතයේ ඇති ජනප්‍රිය සරල ගීත කිහිපයක් නම් කර ඒවා ගයන ගායක /ගායිකාවන් කිහිපදෙනෙකු නම් කරන්න.

ii. සරල ගීතයක කොටස්, බස හා ආකෘතිය පිළිබඳ පහත ඡේදය නිවැරදි ව සම්පූර්ණ කරන්න.

(bits,Introduction,counter,verse,chorus,Melody)

ගීතයක් ආරම්භ කිරීමට පෙර වැයෙන සංගීත ඛණ්ඩය ------- නම් වන අතර ගීතයේ මුල් කොටස --------නමින් ව්‍යවහාර වේ. සරල ගීතයක් සමාජය තුළ ජනප්‍රිය වීමට බලපාන්නේ තනුවේ නිර්මාණාත්මක බව හා රිද්මයයි. තනුව -------නමින් ද ව්‍යවහාරයේ පවතින අතර ගීතයක පද අග හෝ මැද ඇති වචන රහිත හිස්තැන් පුරවන සංගීත කොටස් ---------නමින් හඳුන්වයි. ගීතයේ දෙවන පද කොටස හෙවත් අන්තරා කොටස ---------නමින් හඳුන්වන අතර ගායකයා හෝ ගායිකාව ගීතයේ පද ගයන අතරතුර එම පද යටින් ඇසෙන සංගීත ඛණ්ඩය ----------නමින් ව්‍යවහාර වේ.

(2) i. විදුලි ඕගනය යනු වර්තමානයේ තාක්ෂණික වශයෙන් ඉතා ඉහළ ම දියුණුවක් ලබා ඇති සංගීත භාණ්ඩයකි. එහි පහත සඳහන් කොටස් හඳුනාගෙන නම් කරන්න.



ii. විදුලි ඕගන් අතුරින් ලංකාවේ වඩාත් ම පොදු ජනතාව අතර ප්‍රචලිත වෙළඳ නාමයන් 2ක් ලියන්න.

iii.ව්‍යවහාරික සංගීතයේ දී විදුලි ඕගනය භාවිතා වන අවස්ථා 4 ක් ලියන්න.

(3) *ශ්‍රී ලංකා ගුවන් විදුලිය ආශ්‍රිත ව ගොඩනැගුණු කණ්ඩායම් ගීත එක්තරා කාල වකවානුවක මෙරට රසිකයන්ගේ ජනාදරයට පත් ගීත විශේෂයකි.*

i. සිංහල කණ්ඩායම් ගීයේ නිර්මාතෘවරයා කවුද?

ii. කණ්ඩායම් ගීත ගැයීමේදී භාවිත කළ සංගීත භාණ්ඩ 5ක් නම් කරන්න.

iii. ශ්‍රී ලාකාවේ මුල් ම ගායක කණ්ඩායම් දෙක නම් කරන්න. ඉන් එක් කණ්ඩායමක් පිළිබඳ කෙටි සටහනක් පිළියෙළ කරන්න.

iv. ඔබ දන්නා කණ්ඩායම් ගීත 5ක් ලියන්න.

v. කණ්ඩායම් ගීතවල විශේෂ ලක්ෂණ 5ක් ලියන්න.

(4) හින්දුස්ථානී තාලවලත් දේශීය තාලවලත් එන මත්කැටි අධ්‍යයනය කිරීමත් ඒ අනුව රිද්ම රටා වාදනය කිරීමත් සංගීතය හදාරන සිසුන් සපුරාගත යුතු වන මූලික නිපුණතාවයකි. පහත දැක්වෙන වගුව ඇසුරින් ඔබට ලබා දී ඇති රිද්ම රටාවට ගැළපෙන දේශීය තිත් රූපය හා හින්දුස්ථානී තාලපදය නම් කරන්න. එම රිද්ම රටාවට ගැළපෙන ඕනෑම ගී පාදයක් නියමිත මාත්‍රා අනුව බෙදා ලියන්න.

| රිද්ම රටාව | රිද්ම රටාවට ගැළපෙන දේශීය තිත් රූපය | රිද්ම රටාවට ගැළපෙන හින්දුස්ථානී තාලය | රිද්ම රටාවට ගැළපෙන ගි පාදයක් විභාග කර දැක්වීම |
|---|---|---|---|
| උදා- xx/xx/xx/xx/ | සුලු තනි තිත | ලාවනී තාලය | කිරි/සුදු/හා-/වා- |
| /xxx/x-x/xxx/x-x/ | | | |
| /xx/xxx /xx /xxx/ | | | |
| /x--/xxxx/x--/xxxx/ | | | |
| /xxxx/xxx-/xxxx/xxx-/ | | | |